# 4 ශ්‍රේණිය සිංහල

# ගුරු අත් පොතට

# වැඩ පොත - අංක 13

Part xiii

## L 10, S 10, R 10, W 10

## නිපුණතා ආවරණය - 2021



- ලිඛිත භාෂාවෙන් ලියවුණු ලේඛන කියවීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- වර්තමාන හා අතීත කාල වාක්‍යවල යෙදීම පැහැදිලි කරයි.
- ලිඛිත ව්‍යවහාරය පිළිබඳ අවබෝධයෙන් යුතු ව, නිවැරදි ව භාෂා අභ්‍යාසයේ යෙදෙයි.
- ලේඛන ව්‍යවහාරයට අනුව ලිවීමේ කුසලතාව වර්ධනය කර ගනියි.
- අක්ෂර වින්‍යාසයේ නිවැරදි භාවිතය වර්ධනය කර ගනියි.

**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

## "අපි" යෙදුණු අතීත කාල වාක්‍ය

- "අපි" යන බහු වචන උක්ත පදයට අතීත කාල ක්‍රියා පදය, "මු" ලෙස අවසන් වේ. පහත සඳහන් එක් එක් වාක්‍යවල "මම" යන ඒකවචන උක්ත පදය සහ එයට අදාල අතීත කාල ක්‍රියා පදය යටින් ඉරක් අඳින්න.

1. අපි පාසල් යමු.
   අපි පාසල් ගියෙමු.
2. අපි බත් කමු.
   අපි බත් කෑවෙමු.
3. අපි පාඩම් කරමු.
   අපි පාඩම් කළෙමු.
4. අපි පිරිසිදු ජලය බොමු.
   අපි පිරිසිදු ජලය බිව්වෙමු.
5. අපි සතුටු වෙමු.
   අපි සතුටු වූණෙමු.

- පහත ජේදයේ "අපි" උක්තය ලෙස යෙදුණු, වර්තමාන කාල වාක්‍ය සහ අතීත කාල වාක්‍ය වෙන් කර ලියන්න.

### ගොවිපළක් නැරඹුවෙමු.

"අපි මෙවර ක්ෂේත්‍ර චාරිකාව සඳහා ගොවිපළක් නැරඹීමට යමු" යැයි ගුරුතුමිය යෝජනා කළා ය. ගොවිපළක් යනු විවිධ භෝග වගා කරන භූමියකි. අපි ගොවිපළක් නැරඹීමට ගියෙමු. ගොවිපළේ විවිධ වගාවන් නරඹමින් අපි බොහෝ දුර ගමන් කළෙමු.

"දැන් නම් හොඳට ම බඩගිනියි. අපි දවල් කෑම කමු" යැයි කවිඳු යෝජනා කළේ ය. කුඩා දොළ පාරක් අසල දී අපි දිවා ආහාරය ගත්තෙමු.

"ගොවිපළ නැරඹීමේ දී වගාවන්ට කිසි ම හානියක් නො කළ යුතු බව" ගුරුතුමිය පැවසුවා ය. ගොවිපළේ වගාවන් කොළ පැහැයෙන් දිස් වේ. මල් ජාති, ගෙඩි ජාති මෙන් ම පලා වර්ග ද කදිමට වැඩී තිබුණි.

"ගොවිපළේ අසිරිය ගැන අපි කවි ලියමු" කවීශා පැවසුවා ය. "අපි පන්තියේ දී කවි ලියමු. අපි එහා පැත්තේ තිබෙන සත්ත්ව ගොවිපළටත් යමු"යැයි ගුරුතුමිය යෝජනා කළා ය.

සත්ත්ව ගොවිපළත් නරඹා අපි සවස් වන විට නිවෙස් බලා පිටත් වූණෙමු.

- ❖ වර්තමාන කාල වාක්‍ය

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

- ❖ අතීත කාල වාක්‍ය

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

- වර්තමාන කාල වාක්‍ය සහ අතීත කාල වාක්‍ය වෙන් කර ලියන්න.

1. අපි සැම දෙනාට කරුණාව දැක්වූවෙමු.
2. අපි චිත්‍රයක් අඳිමු.
3. අපි ළමා නාට්‍යයක් නැරඹුවෙමු.
4. අපි තාලයට නටමු.
5. අපි කතන්දර පොත් කියෙවුවෙමු.
6. අපි නිවැරදි ව අකුරු ලියමු.
7. අපි විනෝද චාරිකාවක් ගියෙමු.
8. අපි පිට්ටනියේ සෙල්ලම් කරමු.
9. අපි දිවා ආහාරය ගත්තෙමු.
10. අපි සතුටින් සිටිමු.
11. අපි පාසල් යමු.
12. අපි කෑමට පෙර අත් සෝදමු.
13. අපි කෑමට පෙර අත් සේදුවෙමු
14. අපි පාසල් ගියෙමු.

❖ වර්තමාන කාල වාක්‍ය

.......................................................................

.......................................................................

.......................................................................

.......................................................................

.......................................................................

.......................................................................

.......................................................................

.......................................................................

❖ අතීත කාල වාක්‍ය

.......................................................................

.......................................................................

.......................................................................

.......................................................................

.......................................................................

.......................................................................

.......................................................................

.......................................................................

.......................................................................

- එක් එක් වාක්‍යයට ගැළපෙන අතීත කාල වාක්‍ය වරහන් තුළින් තෝරා හිස්තැනෙහි ලියන්න.

1.අපි ඉවසීමෙන් කටයුතු කරමු.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2.අපි කෞතුකාගාරය නරඹමු.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3.අපි ගීතයක් රස විඳිමු.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

.4.අපි නිරෝගි ව සිටිමු.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

5.අපි සාකච්ඡාවකට සවන් දෙමු.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

6.අපි කාලය අපතේ නොයවමු.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

(අපි සාකච්ඡාවකට සවන් දුන්නෙමු./අපි ගීතයක් රස වින්දෙමු./අපි කාලය අපතේ නොයැව්වෙමු./ අපි නිරෝගී ව සිටියෙමු./අපි කෞතුකාගාරය නැරඹුවෙමු./අපි ඉවසීමෙන් කටයුතු කළෙමු.)

- පහත දී ඇති වර්තමාන කාල වාක්‍ය අතීත කාලයෙන් ලියන්න.

1. අපි පොත් පිළිවෙළකට අසුරමු.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. අපි ශබ්ද නඟා පාඩම කියවමු.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3. අපි වනය පිළිබඳ කවි ලියමු.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

4. අපි නාට්‍යයක් රඟ දක්වමු.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

5. අපි ගුරුවරුන්ට කීකරු වෙමු.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

❖ "අපි" උක්තය ලෙස යෙදුණු වර්තමාන කාල වාක්‍ය පහක් ලියන්න. ලියූ වාක්‍ය පහට අදාළ අතීත කාල වාක්‍ය ද වර්තමාන කාල වාක්‍යයට යටින් ලියන්න.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

❖ අතීත කාල ක්‍රියා පදය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

1. අපි ගෙවත්ත පිරිසිදු . . . . . . . . . . . . . . . . . (කළෙමු./කරමු.)

2. අපි අස්වැන්න නෙළා . . . . . . . . . . . . . . . . . (ගනිමු./ගත්තෙමු.)

3. අපි අඹ පැළ . . . . . . . . . . . . . . . . . . (සිටුවමු./සිටෙවුවෙමු.)

4. අපි පලතුරුවලින් බීම . . . . . . . . . . . . . . . . . (සෑදුවෙමු./සාදමු.)

5. අපි ප්‍රශ්නවලට පිළිතුරු . . . . . . . . . . . . . . . . . (දුන්නෙමු./දෙමු.)

6. අපි රටට සේවය . . . . . . . . . . . . . . . . . (සැලසුවෙමු./සලසමු.)

- දී ඇති වාක්‍ය වර්තමාන කාල වාක්‍යයක් නම් ඊට අදාළ තීරුවේ √ ලකුණ ද, අතීත කාල වාක්‍යයක් නම් ඊට අදාළ තීරුවේ √ ලකුණ ද යොදන්න.

| වාක්‍යය | වර්තමාන කාලය | අතීත කාලය |
|---|---|---|
| අපි සැමදා සමඟි ව සිටිමු. | | |
| අපි උනන්දුවෙන් වැඩ කරමු. | | |
| අපි හොඳින් ඉගෙන ගත්තෙමු. | | |
| අපි දෙමව්පිය සිත් නොරිදවමු. | | |
| අපි යහපත් ලෙස ජීවත් වෙමු. | | |
| අපි අන් අයට උදවු දුන්නෙමු. | | |
| අපි කතන්දර පොත් කියෙවුවෙමු. | | |
| අපි ලස්සනට කවි ලියමු. | | |
| අපි පාරේ දකුණු පැත්තෙන් ගියෙමු. | | |
| අපි විනීත ව හැසිරෙමු. | | |
| අපි ගීතයක් රස විඳිමු. | | |
| අපි ළමා නාට්‍යයක් නැරඹුවෙමු. | | |
| අපි පාඩම් කළෙමු. | | |
| අපි කෑමට පෙර අත් සෝදමු. | | |
| අපි නාට්‍යයක් රඟ දක්වමු. | | |
| අපි රටට සේවය සලසමු. | | |